# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,261 - 2021 දෙසැම්බර් මස 31 වැනි සිකුරාදා - 2021.12.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2554 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2561 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණ-වත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ජනවාරි මස 21 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජනවාරි මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා පොලීසිය

### පොලිස් කොස්තාපල් තනතුර

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2022.01.31 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* : (මාසිකව)

රු. 29,540 - 7 x 300 - 27 x 370 - රු. 41,630.00

මෙම වැටුප් ගණනය කිරීම රා. ප. ච. 03/2016 අනුව සිදුකර ඇත.

තව ද, මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබා දී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (*අ*) | ජීවන වියදම් දීමනාව | රු. 7,800 0 |
| (*ආ*) | රා.ප.ච.03/2016 අනුව තනතුරට අදාළ 40% දීමනාව | රු. 11,816 0 |
| (*ඇ*) | දුෂ්කර දීමනාව | රු. 2,000 0 |
| (ඈ) | අන්තර් දීමනාව | රු. 2,500 0 |
| (*ඉ*) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250 0 |
| (*ඊ*) | සංයුක්ත දීමනා (විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා උපරිමය) | රු. 10,500 0 |
| (*උ*) | සංයුක්ත දීමනා (විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා උපරිමය) | රු. 9,800 0 |

මෙම දීමනාවලට අමතරව -

(*අ*) නොමිලේ ගමන් පහසුකම්,

(*ආ*) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.)

(*ඇ*) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(*ඈ*) සුදුසුකම් සපුරන නිලධාරීන්ට රාජ්‍ය විශ්ව විද්‍යාල මගින් පවත්වනු ලබන උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමට අවස්ථාව හිමිවීම.

(*ඉ*) ප්‍රජා පොලිස් සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා අනුයුක්ත කරනු ලබන නිලධාරීන්ට ඒ සම්බන්ධ දේශීය හා විදේශීය විශේෂිත පුහුණු අවස්ථා හිමිවීම.

(*ඊ*) තමාගේ ක්‍රීඩා කෞශල්‍යය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(*උ*) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

4:1 *වයස් සීමාව* :

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-25 ත් අතර විය යුතු ය.

4:2 *අධ්‍යාපන සුදුසුකම්* :

- අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් මාධ්‍ය භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව අපේක්ෂකයෙකු එකවර විෂයන් 06 කින් සමත් විය යුතු අතර, සම්මාන සාමාර්ථ 04ක් තිබිය යුතු ය. සහ ගණිතය විෂයය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් විය යුතු ය.

**සටහන 01**: ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂයය වර්ගීකරණය අනුව විෂය අංක 41, 44 දරන සෞන්දර්යය විෂය යුගලය එක් විෂයක් ලෙසද අංක 42 සහ 45 දරන සෞන්දර්යය විෂය යුගලය එක් විෂයක් ලෙස ද සලකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

**සටහන 02** : අ.පො.ස. (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.

**සටහන 03**: වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

4:3 *කායික සුදුසුකම්* :

- උස අඩි 05 යි. අඟල් 04 (සෙන්ටි මීටර් 162.5 අවම),
- පපුව අඟල් 30 (සෙන්ටි මීටර් 76 අවම/හුස්ම නාල්ලා).

4.3.1 සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4.3.2 *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් .—* උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච නොමැතිව එක් එක් ඇසෙහි අවම දෘෂ්ටිය 6/12ට අඩු නොවිය යුතු ය. එක් ඇසක දෘෂ්ටිය 6/6 වන විට අනෙක් ඇසෙහි 6/18 ක් විය යුතුය.

4.3.3 පොලිස් සේවයේ ගරුත්වයට නොගැලපෙන හා රාජකාරිවලට බාධා විය හැකි අන්දමේ කෘත්‍රිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය.

4.4 *වෙනත් සුදුසුකම් :*

4.4.1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

4.4.2 අයදුම්කරු අයහපත් චරිතයකින් යුක්ත නොවිය යුතුය.

4.4.3 අයදුම්කරු අවිවාහක විය යුතුය. (දික්කසාද වූවන්, වැන්දඹුවන්, සහ අවිවාහකව දරුවන් සිටින අයවලුන් සුදුසුකම් නොලබයි.)

4.4.4 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

4.4.5 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන 4.1 සහ 4.2 යන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර 4:4 හි සුදුසුකම් බඳවා ගන්නා දිනට ද ඒ ආකාරයෙන්ම තිබිය යුතුය.

05. *මූලික පරීක්ෂණය :*

අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් අතරින් මූලික සුදුසුකම් සහ වයස සපුරා ඇති අයදුම්කරුවන් පමණක් මූලික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේ දී ඉහත ඡේද 4.3 (4.3.2 හා 4.3.3. හැර) හා 4.4 (4.4.2 හා 4.4.4 හැර) සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

මූලික පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන් පොලිස්පති විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ඔරොත්තු දීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අයදුම්කරුවන් විසින් ඔරොත්තු දීමේ පරීක්ෂණයට මුහුණදීමට සුදුසු බවට කැඳවීම් ලිපිය සමග අමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගේ නිර්දේශය සහිතව එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු ය.

| *ක්‍රියාකාරකම* | *කාලය* | *ලකුණු* |
|---|---|---|
| දුර දිවීම මීටර්/ Run meters 1000 | විනාඩි 03ට අඩුනම් | 30 |
| | විනාඩි 03ත් 04ත් අතර | 20 |
| | විනාඩි 04ත් 05ත් අතර | 10 |
| Chinup (වාර 05ක්) | විනාඩි 01 යි | එක් වාරයකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15 කි |
| Pushup (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15 |
| Situp (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15කි |
| Squat Thrust (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15කි |
| Kim Gem (මතකය පරීක්ෂා කිරීම) | අයිතමයන් නිරීක්ෂණය කිරීම සඳහා තත්පර 30 යි, ධාරණය කර ගැනීමට තත්පර 30යි, ලිවීමට තත්පර 120 යි | එක් අයිතමයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10 යි |

සටහන : මීටර් 1000 ක දුරක් විනාඩි 05ක කාලයක දී දිවීමට අසමත් වන අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණයෙන් අසමත් ලෙස සලකනු ලැබේ.

06. *ලිඛිත විභාගය :*

මූලික පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් ලිඛිත විභාගය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත විභාගය පහත විෂයන් යටතේ පවත්වනු ලැබේ.

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. අවබෝධය හා භාෂා හැකියාව | 50 | 40% |
| 02. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 50 | |

07. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

මූලික පරීක්ෂණයෙන් හා ලිඛිත විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පොලිස්පති විසින් පත්කරනු ලැබේ.

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ. |
| 02. වෘත්තීය සුදුසුකම් | 15 | |
| 03. භාෂා හැකියාව | 10 | |
| 04. ක්‍රීඩා කුසලතා | 20 | |
| 05. නායකත්වය/ප්‍රජා සේවාවන් | 20 | |
| 06. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 20 | |
| එකතුව | 100 | |

08. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ලිඛිත විභාගයෙන් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණු සංඛ්‍යාව එකතු කොට අයදුම්කරුවන් ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාව අවරෝහණ ක්‍රමයට සකස් කරනු ලැබේ. එම ලකුණු අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 125%ක අයදුම්කරුවන් ගණනක් පසුබිම් පරීක්ෂණ සහ වෛද්‍ය පරීක්ෂණයන්ට කැඳවා ඉන් සමත්වන අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත තනතුරට බඳවා ගනු ලැබේ.

**සටහන.-** ඉහත පටිපාටීන්ට පරිබාහිරව ජාත්‍යන්තර මට්ටමේ, ජාතික මට්ටමේ හෝ විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්ත වූ හෝ වෙනත් ක්ෂේත්‍රයකින් සුවිශේෂි දක්ෂතා හෝ ප්‍රවීණතා පෙන්නුම් කර ඇති අයදුම්කරුවෙකුගේ උස සහ පපුව පිළිබඳ සුදුසුකම් නොසලකා අනෙකුත් සුදුසුකම් සපුරා ඇත්නම් පත්කිරීම් බලධාරියාගේ අභිමතය පරිදි බඳවා ගත හැකිය.

09. *පසුබිම් පරීක්ෂණය* :

9.1 ලිඛිත පරීක්ෂණයෙන් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් අයදුම්කරු ලබාගත් ලකුණු සංඛ්‍යාවේ එකතුව අවරෝහණ ක්‍රමයට සකස් කර එම ලකුණු අනුපිළිවෙළ අනුව සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත අයදුම්කරුවන් සම්බන්ධයෙන් අයහපත් වාර්තා පිළිබඳව පසුබිම් පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

9.2 මෙහිදී අයදුම්කරුගේ අයහපත් චරිතය අනාවරණය කරගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ද ඔහු සමීපව ඇසුරු කරන්නන්ගේද අයහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

9.3 බඳවා ගැනීමේදී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඕනෑම අවස්ථාවකදී සේවයෙන් ඉවත් කරනු ලැබේ.

10. *වෛද්‍ය පරීක්ෂණය* :

වෛද්‍ය පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරියා ඇතුළු වෛද්‍ය මණ්ඩලයක් විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. මෙහිදී අයදුම්කරුවන් පොලිස් රාජකාරි සඳහා සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකටද යොමු කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි. වෛද්‍ය පරීක්ෂණය සෞඛ්‍ය 169 පෝරමයට අදාළව සිදුකරනු ලබයි. වෛද්‍ය මණ්ඩලය ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්කරුවන්ට අභියාචනා ඉදිරිපත් කල නොහැක.

11. *පුහුණුව* :

11.1 ඉහත පරීක්ෂණ සියල්ලන්ගෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පොලිස්පති විසින් නියම කරනු ලබන දිනකදී පුහුණුව සඳහා කැඳවනු ලැබේ. මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ පවත්වන අතර, ඉන්පසුව ආධුනික කාලය අවසන් වන තෙක් අදල ක්ෂේත්‍ර පුහුණුව ලබාදීම සිදුකෙරෙයි.

11.2 මූලික පුහුණුව සාර්ථකව අවසන් නොකරන නිලධාරීන්ගේ මූලික පුහුණු කාලය දීර්ඝ කිරීම හෝ අවස්ථානුකූලව පත්වීම අවලංගු කිරීම පත්කිරීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

12. *තනතුරේ ස්වභාවය* :

ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය).

13. *සේවා කොන්දේසි* :

13.1 තෝරාගනු ලබන අයදුම්කරුවන් ඉහත 13.3 වගන්තියට යටත්ව තුන් (03) අවුරුදු ආධුනික කාලපරිච්ඡේදයක් සම්පූර්ණ කළ යුතු ය.

13.2 තෝරාගනු ලබන අයදුම්කරුන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් සම්පාදිතව පවත්නා සහ මින්මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන කිසියම් නියෝග වෙතොත් ඒවාටද අනුකූලව කටයුතු කළ යුතුය.

13.3 රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ශ්‍රී ලංකා පොලිස් නියෝග, පොලිස් *ගැසට්* නිවේදන, පොලිස්පති චක්‍රලේඛ, පොලිස් උපදෙස් සංග්‍රහවල විධිවිධාන සහ පත්වීම් ලිපියේ ඇතුලත් කොන්දේසිවලටද යටත් විය යුතු යි.

13.4 ආධුනික කාලය පත්වීම් දින සිට මුල් වසර 03ක් සඳහා බලපැවැත්වෙන අතර, එම කාලය තුළදී නිලධරයා හට විවාහවීමට අවසර දෙනු නොලැබේ. විවාහ විය හැක්කේ පොලිස් චක්‍රලේඛවලින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව පමණි. මෙම රෙගුලාසිය උල්ලංඝනය කළහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

13.5 බඳවා ගන්නා අයදුම්කරුවන් පුහුණුව අවසන් කිරීමෙන් පසු අවුරුදු 05ක අනිවාර්ය සේවා කාලයක් සේවය කල යුතුය. මෙම අනිවාර්ය සේවා කාලය අවසන් වීමට පෙර යම් නිලධරයෙකු තනතුරින් ඉල්ලා අස්වීමට අදහස් කරන්නේ නම්, ඔහුගේ පුහුණුව හා නිළ ඇඳුම් ඇතුළු අනෙකුත් වියදම් වෙනුවෙන් නියම කරනු ලබන මුදල් සියල්ල ඉල්ලා අස්වීමේ ලිපිය භාරදෙන අවස්ථාවේදී, ගෙවීමට කැමැත්ත පලකිරීමේ ගිවිසුමකට එළඹිය යුතුය. ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය/කාර්යය පටිපාටික රීති සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා විධිවිධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ.

13.6 ඉදුරාම බඳවාගන්නා සෑම නිලධරයෙකුම පොලිස් සේවයට පළමුවෙන් පත්කරනු ලැබූ විට තමා සතු වූ ස්වකීය අයිතියෙන්ම ඇත්තාවූ හෝ නමට ලියා තිබෙන්නාවූ

හෝ පවරා තිබෙන්නාවූ හෝ සියලුම වත්කම් පිළිබඳව ද තමා විසින් දරනු ලැබූ සියලුම බැරකම් පිළිබඳවද විස්තර සිය පෞද්ගලික ලිපිගොනුවේ ඇතුලත් කිරීම පිණිස (ප්‍රතිශෝධිත) අංක 261 දරන පොදු ආකෘති පත්‍රයේ ඇතුලත් කර පොලිස්පති වෙත සැපයිය යුතු ය.

නිලධරයා විවාහ වූ වහාම ඉහත කී විස්තරය කලත්‍රයා සම්බන්ධවද ඇතුලත් කර සැපයිය යුතුය.

ඉහත විස්තර කර ඇති ආකාරයේ අලුත් අයිතිවාසිකමක් හෝ වත්කමක් හෝ අත්කරගනු ලැබුවහොත් එසේ අත්කර ගන්නා ලද අයිතිවාසිකම හෝ වත්කම පිළිබඳ සම්පූර්ණ විස්තර තමාගේ පුද්ගලික ලිපිගොනුවේ ඇතුළත් කිරීම සඳහා සෑම නිලධරයෙකු විසින්ම පොලිස්පති වෙත ලිඛිතව දැන්විය යුතු ය.

13.7 ආධුනික පොලිස් කොස්තාපල් නිලධරයන් ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා දිවුරුම් දිය යුතුය.

14\. *පත්වීම ස්ථිර කිරීම* :

ඉඳුරාම බඳවා ගන්නා නිලධාරීන්ගේ වසර 03ක පරිවාස කාලය අවසානයේදී නිලධරයින්ගේ සේවය පත්කිරීම් බලධරයා විසින් ස්ථිර කරනු ලැබේ. පරිවාස කාලය තුළදී පලමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අසමත් වුවහොත් නිලධරයාගේ ජ්‍යෙෂ්ඨත්වය ගතවන අමතර කාලය මත කාර්යය පටිපාටික රීති අනුව තීරණය කර සේවය ස්ථිර කරනු ලැබේ.

එසේ වුවද අමතර වසර 03ක කාලය තුළ පලමු වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත්වන නිලධරයන්ගේ පත්වීම ස්ථිර කිරීම හෝ පරිවාස කාලය දීර්ඝ කිරීම සම්බන්ධව පත්කිරීම් බලධාරියා විසින් තීරණය කලහොත් මිස පත්වීම අවසන් කරනු ලැබේ.

15\. *කාර්යක්ෂමතා කඩඉම* :

කාර්යක්ෂමතා කඩඉම ක්‍රියාත්මක කිරීම පහත පරිදි වේ.

| *කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද* | *කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්‍ෂණය/වෘත්තීය පරීක්‍ෂණය/සහතික පාඨමාලාව/වෙනත්* |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ (සේවය ස්ථිර කිරීමේ පරීක්ෂණය) | පොලිස් කොස්තාපල් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත, ප්‍රායෝගික හා වාචික |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් සැරයන් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩගැස්සීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදරා අවසන් කිරීම |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් මහසැරයන් තනතුරට පත්වී වසර 03ක් ගතවීමට පෙර | තනතුරට හැඩ ගැස්සීමේ පුහුණු පාඨමාලාව සාර්ථකව හදරා අවසන් කිරීම |

16\. *භාෂා ප්‍රවීණතාව* :

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුල ලබාගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතුය. |

17\. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස(IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

18\. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ලේඛන ඉදිරිපත් නොකළ යුතු ය.) :-

(*අ*) උප්පැන්න සහතිකය,

(*ආ*) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්

(*ඇ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

19\. (*අ*) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතුය.

(*ආ*) අයදුම්කරු විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර

අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව භාර නොදිය යුතු ය.

තව ද, මෙම අයදුම්පත්‍රයට අමතරව අන්තර්ජාලය ඔස්සේ මාර්ගගත අයදුම්පත (online application) පිරවීම සඳහා www.police.lk වෙබ් අඩවියට පිවිස එහි ඇති ''join us'' click කිරීම මගින් හෝ www.public.police.lk වෙත පිවිස අයදුම්පත සම්පූර්ණ කර යොමු කරන්න.

20. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.*— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.

සී. ඩී. වික්‍රමරත්න,
පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

**ශ්‍රී ලංකා පොලීසිය**

ආධුනික පොලිස් කොස්තාපල් තනතුර

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා<br>2" x 2 1/2" ප්‍රමාණය |
|---|

ආදර්ශ අයදුම්පත්‍රය

01. (*අ*) වාසගම සහිත සම්පූර්ණ නම (සිංහල) :———.
(උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදි විය යුතුය.)

(i) වාසගම සහිත සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

(*ආ*) මුලකුරු සමග නම (සිංහල) :———.

(i) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

(*ඇ*) අයදුම් කරන තනතුර :———.

02. ජාතික හැඳුනුම්පත් අංකය :———.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :———.

04. අයදුම්කරු උපන් ස්ථානය :————.

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————. පළාත :————.

05. (අ) වර්තමාන ලිපිනය (සිංහල) :————.

(i) වර්තමාන ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.

(ඇ) ස්ථිර ලිපිනය (සිංහල) :————.

(ඈ) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

(ඉ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඊ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(උ) ලිපි හුවමාරු කළ යුතු ලිපිනය :————.
(ඌ) දුරකථන අංකය : නිවස :————. ජංගම :————.
(එ) විද්‍යුත් තැපැල් ලිපිනය :————. (ඒ) වට්ස්ඇප් අංකය :————.

06. (අ) ජන වර්ගය :————.

07. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි.)
වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
අවුරුදු :————. මාස :————. දින :————.

08. උස : අඩි :————. අඟල් :————. පපුව : අඟල් :————.

උස : සෙන්ටිමීටර් :————. පපුව : සෙන්ටිමීටර් :————.

09. (අ) අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :————.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත් නම්,

| විෂය ධාරාව | Z - score අගය |
|---|---|
| | |

10. සුදුසුකම් ලදහොත් ලිඛිත පරීක්ෂණය සඳහා පෙනී සිටින මාධ්‍යය :———.

11. විවාහක/අවිවාහක බව :———.

12. (අ) දැනට කරන රැකියාව :———.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :———.

13. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලීසියේ සේවය කර තිබේ ද ?
තනතුර සහ නිල අංකය :———.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

14. (අ) ඔබ සන්නද්ධ සේවයක /සන්නද්ධ ස්වේච්ඡා සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක/සන්නද්ධ ස්වේච්ඡා සේවයක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

15. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

16. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇත් ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

17. ආයතන ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................... මයා ..................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
ආයතන ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර :———.

දිනය :———.

12-726

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE)

2021 අධ්‍යයන වර්ෂය සඳහා උසස් තාක්ෂණ ආයතනවලට සිසුන් බඳවා ගැනීම

2020 වර්ෂයේ හෝ ඊට පෙර අ.පො.ස. උසස් පෙළ විභාගය සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයදුම්කරුවන්ගෙන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම් කරන පිළිවෙළ :**

අයදුම්කරුවන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා apply.sliate.ac.lk වෙබ් අඩවිය ඔස්සේ පමණක් මාර්ගගතව අයදුම් කළ යුතුය. වෙනත් ඕනෑම ආකාරයකින් අයදුම් කිරීම පිළිගනු නොලැබේ. Z ලකුණු මත සහ SLIATE විසින් පවත්වනු ලබන තෝරා ගැනීමේ විභාගයක ලකුණු මත පදනම්ව HND පාඨමාලා සඳහා තෝරාග ැනීමේ කාණ්ඩ දෙකක් ඇත.

| | |
|---|---|
| Z ලකුණු මත පදනම් වූ SLIATE පාඨමාලා **කාණ්ඩ - 1** | HNDA, HNDBA, HNDBF, HNDE (Civil), HNDE (MECHANICAL), HNDE (Electrical & Electronics), HNDQS, HNDBSE, HNDT (Agri.) |
| තෝරාගැනීමේ විභාගයේ ලකුණු මත පදනම් වූ SLIATE පාඨමාලා **කාණ්ඩ - 2** | HND in English, HNDIT, HNDM, HNDPM, HNDTHM, HNDFT |

සුදුසුකම්ලත් අපේක්ෂකයින් apply.sliate.ac.lk වෙබ් අඩවිය ඔස්සේ අයදුම්කළ යුතුය. HND පාඨමාලා සඳහා වන ප්‍රවේශක සුදුසුකම් 'A' **කොටසේ** සහ උසස් තාක්‍ෂණ ආයතන (ATIs) පිළිබඳ විස්තර 'B' **කොටසේ** බලන්න.

සුදුසුකම්ලත් අපේක්ෂකයින්ට එක් කාණ්ඩයකින් පාඨමාලා පහක උපරිමයක් අයදුම්කළ හැක. එක් කාණ්ඩයකින් අයදුම්පත් එකක් පමණක් එවිය යුතු අතර, එක් කාණ්ඩයක් සඳහා උපරිම ගාස්තුව රුපියල් 500 වේ.

- අයදුම්කරු කාණ්ඩ දෙකටම ඉල්ලුම් කරන්නේ නම් රු. 500 බැගින් වෙන වෙනම සෘජුවම බැංකුවට ගෙවිය යුතු වේ. මාර්ගගත ගෙවීම් නොකළ යුතුවේ.
- බැංකු ලදුපතෙහි සඳහන් මුදල් හුවමාරු අංකය (TRN) අංකය මාර්ගගත අයදුම්පතෙහි සඳහන් කළ යුතුවේ.

**2022 ජනවාරි** මස **31** වැනි දින හෝ ඊට පෙර මහජන බැංකුවේ කොළඹ 02, හයිඩ් පාර්ක් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක **025-2-001-1-3397613** දරන SLIATE ගිණුමට එම ශාඛාවෙන් හෝ ශ්‍රී ලංකාවේ මහජන බැංකු ඕනෑම ශාඛාවක් මගින් ගෙවීම් සිදුකළ හැකිය.

මාර්ගගත අයදුම්පත ලැබුණු බවට තහවුරු වූ විගස පද්ධතිය විසින් උත්පාදිත මුද්‍රිත අයදුම්පතේ අත්සන් තබා, ගෙවීම් සිදු කිරීම මත ලබාගත් ලදුපත ලියාපදිංචි තැපැල් මගින් **2022 ජනවාරි 31** වැනි දින හෝ ඊට පෙර පළමු ප්‍රමුඛතාවය ලබා දී ඇති උසස් තාක්ෂණ ආයතනය (ATI) වෙත යැවිය යුතුය.

**මාර්ගගත පද්ධතිය විසින් උත්පාදනය කළ යොමු අංකය ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.**

මෙම ක්‍රියාවලිය තුළදී සහ ඉන්පසුව අයදුම්පතේ තත්ත්වය කුමක්දැයි ලබා දී ඇති විද්‍යුත් තැපැල් මගින් හෝ ජංගම දුරකථන ඔස්සේ හෝ තැපැල් මගින් දන්වනු ලැබේ.

අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනය වන **2022 ජනවාරි මස** 31 වැනි දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

***පාඨමාලා පවත්වනු ලබන ක්‍රමය :***

පූර්ණ කාලීන පාඨමාලා
අර්ධ කාලීන පාඨමාලා (සති අන්තයේ)
මාධ්‍යය - ඉංග්‍රීසි

අර්ධ කාලීන පාඨමාලා අදාළ ක්ෂේත්‍රයන්හි රැකියාවේ නියුතු අයදුම්කරුවන් සඳහා පවත්වනු ලැබේ.

***පාඨමාලා ගාස්තු :***

පූර්ණ කාලීන (Full-Time) පාඨමාලා ගාස්තු - නොමිලේ
එක් අධ්‍යයන වාරයක් (සමාසිකයක්) වෙනුවෙන් අර්ධ කාලීන පාඨමාලා ගාස්තු පහත සඳහන් පරිදි වේ :-

| | |
|---|---|
| උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDA) | - රු. 7,500 |
| උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (HND in English) | - රු. 12,000 |
| උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDIT) | - රු. 18,000 |

**ලියාපදිංචිය :**

ලියාපදිංචිය සිදු කරන අවස්ථාවේදී අවශ්‍ය ලිපිලේඛනවල මුල් පිටපත් සහ සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුය.

**නේවාසිකාගාර පහසුකම් :**

පහත සඳහන් උසස් තාක්ෂණ ආයතනවල පමණක් පූර්ණ කාලීන සිසුන් සීමිත ප්‍රමාණයකට නේවාසිකාගාර පහසුකම් ලබා දිය හැකිය.

දෙහිවල සහ ගම්පහ උසස් තාක්ෂණ ආයතන - සිසුවියන් සඳහා පමණක්
අම්පාර සහ කොළඹ උසස් තාක්ෂණ ආයතන - සිසුන් සහ සිසුවියන් සඳහා

**"A" කොටස**

HND *පාඨමාලාවන් සඳහා ප්‍රවේශක සුදුසුකම් :*

01. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDA)

**01.1 පූර්ණ කාලීන - වසර 4ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) අ.පො.ස. (උ/පෙළ) ගිණුම්කරණය විෂය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව එකවර සමත් වී තිබීම. (වාණිජ්‍ය විෂය ධාරාවේ සිසුන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. සුදුසුකම් ඇති සිසුන් සඳහා පුරප්පාඩු තිබේ නම් පමණක් තාක්ෂණ විෂය ධාරාවේ සිසුන්ට දෙවන ප්‍රමුඛතාවය දෙනු ලැබේ.)

සහ

අ.පො.ස (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

**01.2 අර්ධ කාලීන - වසර 4ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) ගිණුම්කරණය සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම;

සහ

අ.පො.ස (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම;

හෝ

(ii) අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී ගිණුම්කරණය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

සහ

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) විසින් පවත්වනු ලබන පහත සඳහන් ඕනෑම සහතික පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

(අ) ගණකාධිකරණ ක්ෂේත්‍රයේ උසස් ජාතික ඩිප්ලෝමාව
(ආ) ගණක ශිල්පය පිළිබඳ ජාතික සහතිකය
(ඇ) ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික සහතිකය
(ඈ) ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය

සහ

අ.පො.ස.(සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක්;

සහ

අයදුම්කරු අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක/රාජ්‍ය ව්‍යවසායකයක/පිළිගත් සමාගමක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයකු) නිරතව සිටීම.

සටහන 1 :

උසස් තාක්ෂණ ආයතනවල ධාරිතාවය සමග අනෙකුත් ප්‍රවේශක අවශ්‍යතා සපුරන අවස්ථාවල පහත ඕනෑම සුදුසුකමක් සම්පූර්ණ කරන ලද සිසුන් පළමු වසරින් නිදහස් කර දෙවන වසර සඳහා බඳවා ගැනේ.

(i) SLIATE විසින් පවත්වනු ලබන ව්‍යාපාර පරිපාලනය/ව්‍යාපාර මූල්‍ය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සහ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම.

(ii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පවත්වනු ලබන ව්‍යාපාර මට්ටම I සහ II (හෝ විධායක මට්ටම හෝ CAB I සහ CAB II හෝ පදනම් සහ අන්තර්මාධ්‍ය මට්ටම හෝ බලපත්‍රලාභී I සහ II) සම්පූර්ණ කිරීම.

(iii) වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CIMA -UK) I කොටස සහ II කොටස සම්පූර්ණ කිරීම.

(iv) සහතිකලත් වරලත් ගණකාධිකරණ ආයතනය (ACCAUK) I කොටස සහ II කොටස සම්පූර්ණ කිරීම.

(v) ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) සම්පූර්ණ කිරීම.

(vi) සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CMA - Sri Lanka) විසින් පවත්වනු ලබන ආශ්‍රිත සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ විභාගය (ACMA) සමත්ව තිබීම.

***සටහන*** : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 ප්‍රකාරව බඳවා ගැනීමේ පටිපාටියන්හි දී උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා සහතිකය, පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජවේදී උපාධි සාමාන්‍ය සාමාර්ථයකට විකල්ප අධ්‍යාපනික සුදුසුකමක් ලෙස පිළිගනු ලැබේ.

02. **උසස් ජාතික ව්‍යාපාර පරිපාලනය ඩිප්ලෝමා පාඨමාලාව (HNDBA) පූර්ණ කාලීන - වසර 2 1/2 ක්**

03. **උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමා පාඨමාලාව (HNDBF )**
**පූර්ණ කාලීන - වසර 2 1/2ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

(i) වාණිජ විෂයය ධාරාව යටතේ එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත්වී තිබීම ;

සහ

අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා

තිබීම.

**04. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව (සිවිල්) HNDE (Civil)** - පූර්ණ කාලීන - වසර 3 1/2ක්

**05. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව (විදුලි සහ විද්‍යුත්) HNDE (Electrical and Electronics)** - පූර්ණ කාලීන - වසර 3 1/2 ක්

**06. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව (යාන්ත්‍රික) HNDE (Mechanical)** - පූර්ණ කාලීන වසර 3 1/2ක්

**07. උසස් ජාතික ප්‍රමාණ හා මිණුම් ඩිප්ලෝමා පාඨමාලාව HNDQS** - පූර්ණ කාලීන - වසර 2 1/2ක්

**08. උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව HNDBSE** -පූර්ණ කාලීන - වසර 3 1/2ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

(i) භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (රසායනික විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය) එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**9. උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (HND in English)**

9.1 පූර්ණ කාලීන- වසර 2 1/2ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

(i) ඕනෑම විෂය ධාරාවකින් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත්වී තිබීම (සාමාන්‍ය ඉංග්‍රීසි ප්‍රධාන විෂයයන් තුනෙන් එකක් ලෙස නොසැලකේ.) ;

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ;

හෝ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි සාහිත්‍ය විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

9.2 අර්ධ කාලීන - කාලය වසර 2 1/2ක්

9.1 හි සඳහන් සුදුසුකම්වලට අමතරව රජයේ ආයතනයක/රාජ්‍ය ව්‍යවසායකයක/පිළිගත් සමාගමක (සේවක අර්ථසාධක/සේවක භාරකාර අරමුදල් සම්බන්ධ දැ ඉදිරිපත් කළ යුතුය) හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකුව) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේදී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**10. උසස් ජාතික ආහාර තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDFT) පූර්ණ කාලීන වසර 2 1/2ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) ජීව විද්‍යා හෝ භෞතික විද්‍යා ධාරාවෙන් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම ;

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි භාෂාව හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**11. උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDIT)**

11.1 පූර්ණ කාලීන - වසර 2 1/2ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

ඕනෑම විෂය ධාරාවකින් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම ;

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

11.2 අර්ධ කාලීන - වසර 2 1/2ක්

11.1 හි සඳහන් සුදුසුකම්වලට අමතරව අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක/රාජ්‍ය ව්‍යවසායකයක/පිළිගත් සමාගමක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකුව) නිරතව සිටීම.

**12. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව** (HNDM)

පූර්ණකාලීන - වසර 3ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

(i) ඕනෑම විෂය ධාරාවකින් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත්වී තිබීම ;

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

හෝ

(ii) ගිණුම්කරණ ශිල්පීන් සඳහා වන ජාතික සහතිකය හෝ තාක්ෂණ අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයන (රාජ්‍ය පරිපාලන/අලෙවිකරණය) පිළිබඳ ජාතික සහතිකය ;

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

13. **උසස් ජාතික ව්‍යාපෘති කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDPM)**

**පූර්ණ කාලීන - වසර 2 1/2ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය ;

ඕනෑම විෂය ධාරාවකින් එකවරදී අ.පො.ස. උ/පෙළ විභාගය සමත්වී තිබීම.

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ලබා තිබීම.

14. **උසස් ජාතික තාක්ෂණ කෘෂිකර්මය ඩිප්ලෝමා පාඨමාලාව (HNDT- Agriculture)**

**පූර්ණ කාලීන - වසර 3ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :-

(i) ජීව විද්‍යා විෂය ධාරාවෙන් (මෙම විෂයන්ගෙන් තුනක් ඇතුළුව, රසායන විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව, ජීව විද්‍යාව සහ භෞතික විද්‍යාව) එකවරකදී අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත්වී තිබීම ;

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

15. **උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDTHM)**

**පූර්ණ කාලීන - වසර 3ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :-

(i) ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත්වී තිබීම;

සහ

අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

## **"B" කොටස**

උසස් තාක්ෂණ ආයතනවල **(ATIs)** නම්, ලිපිනයන්, දුරකථන අංක සහ උසස් ජාතික ඩිප්ලෝමා **(HND)** පාඨමාලා
**[**පූර්ණ කාලීන **(FT)** සහ අර්ධ කාලීන **(PT)]**

| | *උසස් තාක්ෂණ ආයතනයේ නම* | *ලිපිනය* | *දුරකථන අංක* | *පවත්වනු ලබන පාඨමාලා* |
|---|---|---|---|---|
| 01 | උසස් තාක්ෂණ ආයතනය - අම්පාර | මහාචාර්ය එවන් ඒ හාඩි මාවත, අම්පාර | 063-2222056<br>063-2223035 | HNDT (Agri)(FT), HNDA (FT), HNDM(FT), HNDIT (FT), HNDTHM(FT), HND in English (FT), HNDA (PT), HND in English (PT) HNDIT(PT) |
| 02 | උසස් තාක්ෂණ ආයතනය - අනුරාධපුරය | අක්කර 111, අනුලා මාවත, පණ්ඩුලගම, අනුරාධපුරය | 025-2234417 | HNDIT(FT), HNDA (FT), HND in English (FT), HNDTHM(FT), HNDIT(PT) HNDA (PT), HND in English (PT) |

| | *උසස් තාක්ෂණ ආයතනයේ නම* | *ලිපිනය* | *දුරකථන අංක* | *පවත්වනු ලබන පාඨමාලා* |
|---|---|---|---|---|
| 03 | උසස් තාක්ෂණ ආයතනය - බදුල්ල | ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව්, බදුල්ල | 055-2230218<br>055-2223818 | HNDIT (FT), HNDA (FT), HNDM(FT), HND in English (FT), HNDTHM(FT), HNDIT (PT), HNDA (PT),HND in English (PT) |
| 04 | උසස් තාක්ෂණ ආයතනය - මඩකලපුව | කෙළින් වීදිය, කෝවිල් කුලම් නැගෙනහිර, අරයාම්පති, මඩකලපුව | 065-2247519<br>065-2247470 | HNDIT (FT), HNDA (FT), HND in English (FT), HNDA (PT), HND in English (PT), HNDIT (PT) |
| 05 | උසස් තාක්ෂණ ආයතනය - කොළඹ | අංක 42, රොඩ්රිගෝ පෙදෙස, කොළඹ 15 | 011-2521152<br>011-2521282 | HNDE (Civil)(FT) , HNDE Mechanical) (FT), HNDE (Electrical & Electronics) (FT), HNDQS(FT), HNDBSE(FT) |
| 06 | උසස් තාක්ෂණ ආයතනය - දෙහිවල | අංක 51, වෛද්‍ය පාර, දෙහිවල | 011-2738349 | HNDIT (FT), HNDA (FT), HNDM (FT), HNDBA (FT), HND in English (FT), HNDBF(FT), HNDTHM(FT), HNDA (PT), HND in English (PT) |
| 07 | උසස් තාක්ෂණ ආයතනය - ගාල්ල | සිරිධම්ම මාවත, ලබුදූව, අක්මීමන, ගාල්ල. | 091-2246179 | HNDE (Civil)(FT), HNDE(Mechanical) (FT), HNDE(Electrical & Electronics) (FT) HNDQS(FT), HNDT(Agri) (FT) HNDA (FT), HNDM(FT), HNDTHM(FT), HNDBA(FT), HND in English (FT), HNDA (PT), HNDIT (PT), HND in English (PT) |
| 08 | උසස් තාක්ෂණ ආයතනය - ගම්පහ | නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ | 033-2287519<br>033-2292544 | HNDT (Agri) (FT), HNDIT (FT), HNDFT(FT), HNDCSPT(FT), HNDA (FT), HNDA (PT),), HNDIT (PT), |
| 09 | උසස් තාක්ෂණ ආයතනය - යාපනය | අංක 665/2, වෙරළ පාර, ගුරුනගර්, යාපනය | 021-2222595<br>021-2229803 | HNDE (Civil)(FT) , HNDE (Electrical & Electronics)(FT), HNDA (FT), HND in English(FT), HNDQS(FT), HNDM(FT), HNDIT (FT), HNDIT (PT), HNDA (PT), HND in English (PT) |
| 10 | උසස් තාක්ෂණ ආයතනය - මහනුවර | අංක 16, කැප්පෙටිපොල මාවත, මහනුවර | 081-2232097<br>081-2226644 | HNDIT (FT), HNDA (FT), HNDM(FT), HNDBA(FT), HND in English (FT), HNDTHM (FT), HNDA (PT),HND in English (PT) |
| 11 | උසස් තාක්ෂණ ආයතනය - කෑගල්ල | බණ්ඩාරනායක මාවත, කෑගල්ල. | 035-2221297<br>035-2221713 | HNDIT(FT), HNDA(FT), HND in English (FT), HNDPM(FT), HNDA (PT), HND in English (PT) |

| | උසස් තාක්ෂණ ආයතනයේ නම | ලිපිනය | දුරකථන අංක | පවත්වනු ලබන පාඨමාලා |
|---|---|---|---|---|
| 12 | උසස් තාක්ෂණ ආයතනය - කුරුණෑගල | අංක 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල | 037-2229583<br>037-2224911 | HNDIT(FT),HNDA(FT),HNDM(FT)<br>HND in English (FT), HNDTHM(FT)<br>HNDIT (PT), HNDA (PT), HND in English (PT) |
| 13 | උසස් තාක්ෂණ ආයතනය - මන්නාරම | ලසැල් ඉංග්‍රීසි මාධ්‍ය පාසල් ගොඩනැගිල්ල, තලෙයිමන්නාරම පාර, මන්නාරම | 023-3122555 | HND in English (FT),<br>HNDIT (FT) |
| 14 | උසස් තාක්ෂණ ආයතනය -නාවලපිටිය | අංක 154/6, ගම්පොල පාර, (බ්ලැක් ස්ට්‍රීට්) ආයිශ්වර්යා ශාලාව, 4 වන මහල, නාවලපිටිය | 054-2050634 | HNDTHM(FT), HNDM(FT) |
| 15 | උසස් තාක්ෂණ ආයතනය - රත්නපුරය | නව නගරය, රත්නපුරය | 045-2231492<br>045-2231493 | HNDIT (FT), HNDA (FT), HND in English (FT)<br>HNDA (PT), HND in English (PT) |
| 16 | උසස් තාක්ෂණ ආයතනය - සමන්තුරේ | උසස් තාක්ෂණ ආයතන මාවත, සමන්තුරේ | 067-2261304 | HNDIT (FT),HNDA (FT), HND in English (FT), HNDM (FT) HNDIT (PT) HNDA (PT), HND in English (PT), |
| 17 | උසස් තාක්ෂණ ආයතනය - තංගල්ල | යායවත්ත, නෙටොල්පිටිය, තංගල්ල | 047 2241845<br>047 2241846 | HNDIT (FT), HNDA (FT), HND in English (FT),<br>HNDA (PT), HND in English (PT) |
| 18 | උසස් තාක්ෂණ ආයතනය - ත්‍රිකුණාමලය | කන්නියා පාර, වරෝදයනගර්, ත්‍රිකුණාමලය | 026 2223232<br>026 2050617 | HNDIT (FT), HNDA (FT), HND in English (FT), HNDTHM (FT),<br>HNDA (PT), HNDIT (PT), HND in English (PT) |
| 19 | උසස් තාක්ෂණ ආයතනය - වවුනියාව | ඒ 9 පාර, වෙප්පන්කුලම්, ඕමාන්තෙයි, වවුනියාව | 024 2052733 | HNDA (FT) HND in English (FT)<br>HNDA (PT), HND in English (PT) |

*සටහන :*

01. අයදුම්කරු අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනයට පෙර අවශ්‍ය ප්‍රවේශක සුදුසුකම් සපුරා තිබිය යුතුය.
02. උසස් ජාතික ඩිප්ලෝමා පූර්ණ කාලීන පාඨමාලා සඳහා අ.පො.ස (උ/පෙළ) සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට තිබිය යුතු අවම ලකුණු ප්‍රමාණය 25කි. අයදුම්කරු උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබා තිබිය යුතුය.
03. කාණ්ඩ දෙකෙහි සඳහන් උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා සඳහා සුදුසු අපේක්ෂකයින් තෝරාගැනීම පොදු ලිඛිත විභාගයක් හරහා ආයතනික වශයෙන් සිදු කෙරේ.
04. වයස අවුරුදු 23ට අඩු, පූර්ණ කාලීන සිසුන් සඳහා ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලැබේ.
05. යම් උසස් තාක්ෂණ ආයතනයක නියමිත පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා එම අධ්‍යයන පාඨමාලාවට අවම වශයෙන් සිසුන් 50ක් ලියාපදිංචි විය යුතුය. යම් පාඨමාලාවක් ආරම්භ කිරීමට ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක, එම සිසුන්, එම පාඨමාලාව පවත්වන ආසන්නතම උසස් තාක්ෂණ ආයතනය වෙත මාරු කරනු ලැබේ. මේ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ තීරණය, අවසාන තීරණය වේ.

06. සියලුම පූර්ණ කාලීන පාඨමාලා සඳහා වන සිසුන්, සතියේ දිනවල සහ අවශ්‍ය වුවහොත් සති අන්ත දිනවල දේශන සඳහා සහභාගි විය යුතු ය.
07. අර්ධ කාලීන පාඨමාලා සති අන්තයේ පවත්වනු ලැබේ.
08. පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා පවත්වනු ලබන්නේ දේශන ශාලාගතව, මාර්ගගතව හෝ ඒ දෙයාකාරයටම අවශ්‍යතාවය මත වේ.
09. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා HNDA (පූර්ණ කාලීන) පාඨමාලාවේ පළමුවන වසර හා දෙවන වසරවල අධ්‍යයන කටයුතු සතියේ දිනවල දී පමණක් පවත්වනු ලැබේ. මෙම පාඨමාලාවේ තුන්වන හා හතරවන වසර සඳහා වන දේශන සති අන්තයේදී පැවැත්වේ.
10. HNDM පාඨමාලාවල පළමු හා දෙවන වසර සඳහා වන දේශන සතියේ දිනවලදී පැවැත්වේ. මෙම අධ්‍යයන පාඨමාලාවේ තුන්වෙනි වසරේ දේශන සති අන්තයේ පවත්වනු ලැබේ.
11. පූර්ණ කාලීන පාඨමාලාවල සිසුන් අවම වශයෙන් මාස 06ක කාලයක් අදළ ක්ෂේත්‍රයේ ප්‍රායෝගික පුහුණුව ලබාගත යුතුය.
12. අර්ධ කාලීන අයදුම්කරුවන් අදළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරතව සිටිය යුතුය.
13. යම් උසස් තාක්ෂණ ආයතනයක පූර්ණ කාලීන පාඨමාලාවකට තෝරාගැනීමෙන් පසුව වෙනත් උසස් තාක්ෂණ ආයතනයකට කිසිදු සිසුවෙක් හෝ සිසුවියක් කුමන හේතුවක් මත මාරුවීම් සිදුකරනු නොලැබේ.
14. යම් උසස් ජාතික ඩිප්ලෝමා HND පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී ඇති සිසුන් අදාළ ආයතනය විසින් ලබා දී ඇති ලියාපදිංචිය සඳහා වන අවසාන දිනයේ සිට දින 60ක් ඇතුළතදී ස්වකීය ලියපදිංචිය අවලංගු කරගැනීමට අවසර දෙනු ලැබේ.
15. දින 60කට පසුව ස්වකීය ලියාපදිංචිය අවලංගු කරන සිසුන් වෙතින් ලියාපදිංචි දිනයේ සිට මසකට රු. 5,000.00 බැගින් අයකරනු ලැබේ. [අභ්‍යන්තර චක්‍රලේඛ (විභාග) 04/2019;2019.07.12]
16. පූර්ණ කාලීන සහ අර්ධ කාලීන සිසුන් සඳහා වන අවසන් සමාසික විභාග සතියේ දිනවල හා සති අන්තයේ දිනවල පවත්වනු ලැබේ.
17. ශාස්ත්‍රීය කමිටු රැස්වීම විසින් නිර්දේශ කොට පාලක සභාව විසින් අනුමත කරන ලද වෙනත් ඕනෑම සුදුසුකමක්, පාඨමාලා ප්‍රවේශය සඳහා සලකා බලනු ලැබේ.
18. අ.පො.ස. (උ/පෙළ) සහ අ.පො.ස. (සා/පෙළ) විභග පාලනය වී තිබිය යුත්තේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙනි.
19. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කොට ඇති ඕනෑම අයදුම්කරුවෙකු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
20. 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා උසස් තාක්ෂණ ආයතන වෙත සිසුන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් SLIATE අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.
21. වැඩිදුර තොරතුරු සඳහා www.sliate.ac.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2022.01.31** දින වේ.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE)

12-681

---

සංශෝධනයයි

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2021 වර්ෂය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍ර අංක 2257 හා 2021.12.03 දිනැතිව පළ කරන ලද ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2021 *ගැසට්* නිවේදනයේ අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2022.01.18 ලෙස සංශෝධනය කරනු ලැබේ.

ඩී. එම්. එල්. බණ්ඩාරනායක,
ලේකම්,
කෘෂිකර්ම අමාත්‍යාංශය.

රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල,
2021 දෙසැම්බර් මස 29 වැනි දින.

12-765

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2020 වර්ෂය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ සිසු හෙද පුහුණු පාඨමාලාව සඳහා බඳවාගැනීමට සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් 2022.01.31 වැනි දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා අයදුම් කළ හැක්කේ මෙම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය (www.health.gov.lk) ඔස්සේ පමණි.

*සැලකිය යුතුයි :*

එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. එක් අයදුම්පතකට වාඩා වැඩියෙන් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ගේ සියලු අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2018 සහ 2019 යන වර්ෂ දෙකෙන්ම අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් අයෙකුට වුවද ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. එවැනි අයදුම්කරුවන්ට තම මනාපය අනුව තෝරාගනු ලබන එක් වර්ෂයකින් පමණක් අයදුම්පතක් ඉදිරිපත් කළ හැකිය. වර්ෂ දෙකෙන්ම අයදුම්පත් ඉදිරිපත් නොකළ යුතුය. එසේ නොමැතිව වර්ෂ දෙකෙන්ම අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වේ නම් එකී සියලු අයදුම්පත්ද කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කිසිදු අයදුම්කරුවෙකු තමා විසින් ඉදිරිපත් කරනු ලබන විද්‍යුත් අයදුම්පතට සාවද්‍ය තොරතුරු ඇතුළත් නොකළ යුතුය. සාවද්‍ය තොරතුරු ඇතුළත් කර ඉදිරිපත් කර ඇති සෑම අයදුම්පතක්ම කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කර, එවැනි අයදුම්කරුවන්ට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමුකරන අතර, ඔවුන්ගේ නම් නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඇතුළත් කිරීමටද කටයුතු කරනු ලැබේ.

සෑම අයදුම්කරුවෙකු විසින් ම පළමුව මෙම *ගැසට් නිවේදනයේ* සහ වෙබ් අඩවියෙහි මේ සමග ඉදිරිපත් කර ඇති විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස් පත්‍රිකාවේ සඳහන් සියලුම කරුණු ඉතා හොඳින් කියවා තේරුම්ගෙන මෙම පාඨමාලාව සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමට තමන් සුදුස්සෙකු බවට තහවුරු කර ගත යුතුය. අනතුරුව *ගැසට් නිවේදනයේ* 9.4, 9.5, 9.6 හා 9.7 යන ඡේදවල දක්වා ඇති ලේඛන සූදානම් කරගෙන අයදුම්පත සම්පූර්ණ කිරීමට කටයුතු කිරීමෙන් ඔබට අයදුම්පත් යොමු කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව සිදුකළ හැකි ය.

02. *පාඨමාලාවට අදාළ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-*

| *අ.පො.ස (සා. පෙළ) සුදුසුකම්* | *අ.පො.ස (උ. පෙළ) සුදුසුකම්* | *පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් සුදුසුකම් සහ විශේෂ කරුණු* |
|---|---|---|
| සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් 04ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම. | 2018 වර්ෂයේ හෝ 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ යන අවස්ථාවලින් එකකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂය ධාරාවට අයත් ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 03කින් එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)<br><br>*හෝ*<br><br>2018 වර්ෂයේ හෝ 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ යන අවස්ථාවලින් එකකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතික විද්‍යා විෂය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා උසස් ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 03කින් එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) | පූර්ණකාලීන පාඨමාලාවක් වන මෙහි කාලසීමාව අවු. 03 කි.<br><br>පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය යුතුය.<br><br>2022.01.31 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතු ය.<br><br>උස අඩි 04 යි, අඟල් 10 කට (147.3 CM) නොඅඩු විය යුතු ය.<br><br>අවිවාහක විය යුතු ය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකි ය. |

අංක 01 වගුව

3. පාඨමාලාවට තෝරාගැනීමේ ක්‍රමවේදය :

3.1 සිසු හෙද පුහුණුව සඳහා බඳවා ගැනීම අංක 1837/8 හා 2013.11.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාවට හා ඊට වරින්වර සිදුකරන ලද සංශෝධන ප්‍රකාරව සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් සිදුකරනු ලැබේ. (පිරිමි අයදුම්කරුවන් බඳවා ගැනීම හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව මෙම අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල අවශ්‍යතා පදනම් කරගනිමින් සිදුකරනු ලැබේ.)

3.2 දිවයිනෙන් බඳවා ගැනීමට නියමිත සම්පූර්ණ සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.3 ඉන්පසු එම එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව අදාළ දිස්ත්‍රික්කයෙන් 2018 වර්ෂයේ හෝ 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) යන විභාගවලින් එකකදී එම එක් එක් විභාගයෙන් අයදුම්කර අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති සම්පූර්ණ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙද අදළ දිස්ත්‍රික්කයෙන් එම එක් එක් විභාගයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.4 ඉන්පසු එම එක් එක් විභාගයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව එම විභාගයේ ජීව විද්‍යා විෂය ධාරාව හා භෞතික විද්‍යා විෂය ධාරාව යටතේ මෙම පාඨමාලාවට අයදුම්කර අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති සම්පූර්ණ අයදුම්කරුවන් සංඛ්‍යාවට සාමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් විභාගයෙන් අදාළ එක් එක් විෂය ධාරා යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.5 එලෙස එම එක් එක් විභාගයෙන් (2018 වර්ෂයේ හෝ 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ - නව නිර්දේශය) එක් එක් විෂය ධාරාව යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කර එම සංඛ්‍යාවෙන් 5% ක් පිරිමි අයදුම්කරුවන්ගෙන් ද, 95%ක් ගැහැණු අයදුම්කරුවන්ගෙන් ද සමන්විත වන ලෙස එම එක් එක් විභාගවලින් එක් එක් විෂය ධාරා යටතේ දිස්ත්‍රික්කයේ ඉහළම Z අගය ලබා ඇති අයදුම්කරුවන් පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ.

4. *යෝග්‍යතාව* :

සෑම අයදුම්කරුවෙකුම -

4.1 ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.;

4.2 අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් ද යහපත් කායික සහ මානසික සෞඛ්‍යයකින් ද යුක්ත විය යුතු ය.

4.3 තමන් අයදුම්කරන දිස්ත්‍රික්කය පදිංචි දිස්ත්‍රික්කය ලෙස සලකා බැලීම සඳහා අයදුම්කරු එම දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2022.01.31 වැනි දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව පදිංචි වී සිටිය යුතු ය. එය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කල යුතුය. කෙසේ වෙතත් එලෙස අඛණ්ඩ වසර 03 ක පදංචි කාලසීමාව සනාථ කළ නොහැකි අයදුම්කරුවන් සඳහා ඔවුන්ගේ පදිංචි දිස්ත්‍රික්කය ලෙස ඔවුන් විසින් අයදුම්කර ඇති දිස්ත්‍රික්කය ලබාදිය නොහැකි අතර, එවැනි අයදුම්කරුවන්ගේ පූර්ව පදිංචි කාලසීමාව පිළිබඳව සලකා බලා ඊළඟ අත්‍යාසන්න වැඩිම කාලසීමාවක් පදිංචිව සිටි දිස්ත්‍රික්කය අයදුම්කරුට හිමි දිස්ත්‍රික්කය ලෙස සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ. මේ සඳහා අවශ්‍ය ලේඛන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත අයදුම්කරු විසින් නොපමාව ඉදිරිපත් කළ යුතුය.

*සටහන* :-

යම් අයදුම්කරුවෙකුගේ පියා හෝ මව හෝ රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටීම හේතුවෙන් හෝ වෙනත් නොවැළැක්විය හැකි කරුණක් මත යම් අයදුම්කරුවෙකුට පූර්වාසන්න වසර 03 ක අඛණ්ඩ පදිංචිය සනාථ කළ නොහැකි අවස්ථාවල දී පිළිගත හැකි හේතු ඉදිරිපත් කළහොත් ඒ පිළිබඳව අවසන් තීරණය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් ගනු ලැබේ.

5. පාඨමාලාව සඳහා අයදුම් කිරීමට හෝ ඇතුළත් වීමට හෝ නොසුදුස්සන් :

5.1 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවත්නා රජයේ විශ්ව විද්‍යාලයක/රජයේ විශ්ව විද්‍යාල විද්‍යායතනයක අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් වලින් බඳවාගනු ලබන උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා ''රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද'' යටතේ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වී සිටින /හදාරමින් සිටින අය.

5.2 ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක අ.පො.ස.(උ.පෙළ) සුදුසුකම් වලින් බඳවාගනු ලබන පඨමාලාවක් සඳහා ලියාපදිංචි වී සිටින /හදාරමින් සිටින අය.

5.3 සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම්වලින් බඳවාගනු ලබන පූර්ණකාලීන පාඨමාලාවක ලියාපදිංචි වී සිටින /හදාරමින් සිටින අය.

5.4 ඉහත 5.1, 5.2 හා 5.3 යටතේ සඳහන් ආයතනයක පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී සිටින සිසුන් මෙම *ගැසට් නිවේදනය* පළවීමෙන් පසුව ලියාපදිංචිය අවලංගු කරගත්ත ද ඔවුන් මේ සඳහා අයදුම් කිරීමට/ඇතුළත් වීමට සුදුසුකම් නොලබති. තවද *ගැසට් නිවේදනය* පළවීමෙන් පසුවද/සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසුවද ඉහත ආයතනයක අදාළ පාඨමාලාවක ලියාපදිංචි වී එය අවලංගු කර ගත්තද ඔවුහු ද මෙම පාඨමාලාව සඳහා ඇතුළත් වීමට සුදුසුකම් නොලබති.

5.5 විවාහය ලියාපදිංචි කර ඇති හෝ දික්කසාද වූ හෝ අය.

***06. වෙනත් කරුණු :***

6.1 ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම්, එම උපාධිය බලපැවැත්වෙන දිනය (EFFECTIVE DATE) මෙම පාඨමාලාවට බඳවා ගන්නා දිනට පෙර දිනයක් විය යුතු ය.

6.2 ඉහත කොන්දෙසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද අනිවාර්යයෙන් ම ඔබම මෙම පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේය යන්න මෙම *ගැසට් නිවේදනයේ* කුමන හෝ වගන්තියක් මගින් අදහස් නොකෙරෙන බව තරයේ සිහි තබා ගත යුතු ය. එමෙන් ම ඉහත කොන්දේසි සම්පූර්ණ කර තිබුණ ද, ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් ඔබ කිසිදු අයුරකින් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබන බව දැනගත යුතු ය.

6.3 ඉහත 5.1, 5.2 හා 5.3 යටතේ සඳහන් ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක ලියාපදිංචි වී සිටින /හදාරමින් සිටින අයෙකු හෝ 5.4 හා 5.5 ඡේදවල දක්වා ඇති නුසුදුසුකම් පවතින අයෙකු මේ සඳහා අයදුම්කර, පසු අවස්ථාවකදී අනාවරණය වුවහොත් අදාළ පාඨමාලාවෙන් /තනතුරෙන් ඉවත් කර ඒ වනතෙක් ඔවුන් වෙනුවෙන් රජය විසින් දරා ඇති සියලුම වියදම් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

6.4 අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2022.01.31 දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

7. *අයදුම්කළ යුතු ක්‍රමය :*

7.1 මෙම පුහුණු පාඨමාලාව සඳහා අයදුම් කළ යුත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය (www.health.gov.lk) මගිනි. ඒ සඳහා මෙම අමාත්‍යාංශයේ වෙබ්අඩවියේ අදාළ කොටසේ ඇති අයදුම්පත සම්පූර්ණ කර එවිය යුතු ය. **අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් පත්‍රිකාව බලන්න.**

7.2 අයදුම්කරුවන් රු.500.00ක මුදලක් ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුමට ගෙවිය යුතු ය. ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝ මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍රයකින් හෝ අන්තර්ජාල බැංකු සේවාවක් මගින් හෝ ගෙවීම් කළ හැකි ය. මෙම ගාස්තු කවර හේතුවක් නිසා හෝ ආපසු නොගෙවන අතර, වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ. ඔබ විසින් උක්ත ගෙවීමට අදාළ සාක්ෂි (රිසිට් පත) ළග තබාගත යුතු අතර, සම්මුඛ පරීක්ෂණයට සහභාගීවුවහොත් ඉදිරිපත් කළ යුතුය.

7.3 මෙලෙස ඔබ විසින් සාර්ථකව උඩගත කරන ලද (UPLOAD) අයදුම්පතෙහි පිටපත් **තැපැල් මගින් මෙම අමාත්‍යාංශය වෙත එවීමට අවශ්‍ය නොවේ.** එහෙත්, අයදුම්පත උඩගත කිරීමෙන් පසුව ලැබෙන අංක 5 කින් යුත් කේතය, මුද්‍රිත පිටපත් (PRINT OUT) පසුව ලබා ගැනීමේ පහසුව සඳහා සුරක්ෂිතව තබාගන්න. එසේම අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් ලබාගෙන එහි අදාළ ස්ථානයේ ඔබගේ අත්සන යොදා 8.1 ඡේදයෙහි දක්වා ඇති නිලධාරියෙකු ලවා සහතික කරවාගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවුවහොත් රැගෙන ආ යුතුය.

***සටහන*** :-මෙම පාඨමාලාව සඳහා අයදුම්කිරීමට සියලු සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අයදුම්පත සම්පූර්ණ කිරීමේදී කිසියම් ගැටළුවක් ඇති වුව හොත් පමණක් ඒ සම්බන්ධයෙන් තාක්ෂණික සහාය ලබාගැනීම සඳහා සතියේ වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා කාලය තුළ සෞඛ්‍ය අමාත්‍යාංශයේ **මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ ඒකකයේ දුරකතන අංක 0112 340 077 අමතන්න.** (අදාළ සියලු තොරතුරු මෙම *ගැසට්* පත්‍රයේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි සවිස්තරව දක්වා ඇති බැවින්, වෙනත් කරුණු පිළිබඳව විමසීමෙන් වලකින්න.)

8. ***අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම*** :-

8.1 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු/ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විශ්වයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 512,148.00 කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතු ය.

8.2 මෙම *ගැසට් නිවේදනයේ* දැක්වෙන නියමයන්ට අනුකූල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. ***සම්මුඛ පරීක්ෂණය සඳහා ඔබව කැඳවනු ලැබුවහොත් ඉදිරිපත් කළ යුතු තොරතුරු*** :-

9.1 ඔබ විසින් සාර්ථකව උඩගතකර ඇති විද්‍යුත් අයදුම්පත අනුව අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කඳවනු ලැබේ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් මෙම තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ සහ මෙම *ගැසට් නිවේදනයේ* දක්වා ඇති සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලිපිලේඛනයන්හි ***මුල් පිටපත්*** ඉදිරිපත් කළ යුතු ය.

9.2 විද්‍යුත් මාධ්‍යයෙන් උඩගත කරන ලද (UPLOAD) අයදුම්පතෙහි මුද්‍රිත පිටපත (8.1 ඡේදයේ දක්වා ඇති නිලධාරියෙකු ලවා සහතික කරන ලද).

9.3 උප්පැන්න සහතිකය.

9.4 අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දැක්වෙන සහතිකය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද).

9.5 අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද).

9.6 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය.

9.7 රු. 500 ක මුදල ගෙවූ බවට සනාථ කෙරෙන රිසිට්පත

9.8 පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය.

9.9 අවිවාහක බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේ රු. 50.00 ක මුද්දරයක් මත අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශය.

*සටහන* :

(අ) ඉහත 9.2 සිට 9.9 දක්වා වන ඡේදවල සඳහන් ලේඛනවල තමා විසින්ම සහතික කරන ලද ඡායා පිටපත්, සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමේදී රැගෙන ආ යුතු ය.

(ආ) පුහුණු පාසල්වල පවතින ඉඩ පහසුකම් හා සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවාගත යුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

(ඇ) සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි අඩංගු කිසිදු වගන්තියකින් අදහස් නොකෙරේ.

(ඈ) සම්මුඛ පරීක්ෂයෙන් පසු තෝරාගත් අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු http:// www. health.gov.lk වෙබ්අඩවියේ පළකරනු ලබන අතර කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.

(ඉ) *ගැසට් නිවේදනයේ* දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් නියමිත පරිදි පවත්වන ලද සම්මුඛ පරීෂණ සඳහා සහභාගී නොවූවන් විසින් හෝ සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගි වී නියමිත දිනට ලියාපදිංචි නොවූ අයදුම්කරුවන් විසින් අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමෙන් පසුව පාඨමාලාවට ඇතුළත් වීම සඳහා ඉදිරිපත් කරනු ලබන අභියාචනා කිසිදු හේතුවක් මත සලකා බලනු නොලැබේ.

10. *පුහුණු කිරීමේ පරිපාටිය* :

10.1 සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව තෝරාගනු ලබන අයදුම්කරුවන් මෙම පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ. පාඨමාලා කාලය සහ හැදැරිය යුතු මාධ්‍යය අංක I වගුවේ දක්වා ඇත.

10.2 පුහුණු පාසල්වලට ඇතුළත් කරන සිසුන් ඒවායෙහි බලපැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලටද යටත් වනු ඇත.

10.3 පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ විභාග, නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන හෝ පුහුණුවට බඳවාගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙන අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් අසත්‍ය බවට අනාවරනය වන හෝ සිසුන්ගේ පුහුණුව, ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

10.4 පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ දී සිසුන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන V හි විධිවිධානවලට අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

10.5 පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේදී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පාඨමාලාව අත්හැර නොයන බවටත්, පුහුණුව සම්පූර්ණයෙන් ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම ලදහොත් අවම වශයෙන් වසර දහයක (10) කාල පරිච්ඡේදයක් රාජ්‍ය සේවය/පළාත් රාජ්‍ය සේවය යටතේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු ය. ඉහත (10.3) කරුණු ප්‍රකාරව, පුහුණු කාලසීමාව තුළ දී පුහුණුවෙන් ඉවත් වන, පුහුණුව හැර යන, පුහුණුවෙන් ඉවත් කිරීමට සිදු වන හෝ පත්වීම් ලැබ වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදය ඉහත පරිදි අදාළ, තනතුරේ සේවය කිරීමට අපොහොසත් වන සිසුන් පුහුණුවෙන්/තනතුරෙන් ඉවත් කරන අතර අදාළ කාලය තුළදී ඔවුන් වෙත රජය විසින් ගෙවන ලද දීමනා, දරන ලද වියහියදම් හා ගිවිසුම් ගත මුදල සෞඛ්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත්, එම මුදල් අය කර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව හා නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

10.6 මෙම පාඨමාලාව සඳහා අයදුම්කරන අයදුම්කරුවන් අයදුම්පත් යොමු කරන දිනය වන විට අවිවාහක විය යුතු අතර, පුහුණුව ලබන කාලසීමාව තුළ දී ද අවිවාහකව සිටීම අනිවාර්යය වේ.

11. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්* :

11.1 පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී, එහෙත් පුහුණුව අවසන් කරන දිනය වන විට පවත්නා පුරප්පාඩු මත සකස් කරන ප්‍රමුඛතා පුරප්පාඩු ලේඛනය අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරින් වෙත ස්ථාන මාරු ලබා දීමෙන් අනතුරුව ඉතිරිවන

පුරප්පාඩු සඳහා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරන සිසුන්ගේ අවසන් පරීක්ෂණ කුසලතාවය සැලකිල්ලට ගෙන අදාළ තනතුරේ III වන ශ්‍රේණියේ තනතුරකට පත් කිරීම සඳහා සලකා බලනු ලැබේ. එලෙස තෝරා ගනු ලබන සිසුන් පවතින පුරප්පාඩු අනුව ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා බැඳී සිටිය යුතු ය.

11.2 එකී පත්වීම්ලාභීන් වෙත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

11.3 අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් නිවැරදිව ඇතුළත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසුව හෝ ඉහත කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/ තනතුරෙන් පහකරන අතර, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔවුන්ගේ නම් ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තව ද, පුහුණු කාලය තුළ දී රජය විසින් ගෙවන ලද දීමනා, දරන ලද වියහියදම් හා ගිවිසුම්ගත අදාළ මුදල අයකර ගැනීමට ද කටයුතු කරනු ලැබේ.

11.4 තෝරාගත් අයදුම්කරුවන් පාඨමාලාව හැදෑරීම හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

11.5 ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධව පනවන ලද රීති, රෙගුලාසි හා නියෝගවලට, සේවා ව්‍යවස්ථාවල විධිවිධානයන්ට, රජයේ මුදල් රෙගුලාසිවලට, රජයේ චක්‍රලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාළව වරින්වර පනවනු ලබන නියමවලට හා සංශෝධනවලට ද යටත් වනු ඇත.

11.6 පාඨමාලාවට බඳවාගනු ලබන සිසුන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබාදෙන්නේ නම්, ඒ සඳහා අදාළ තක්සේරු නිවාස කාමර කුළිය, ජල හා විදුලි බිල්පත් අය කරනු ලැබේ.

11.7 පුහුණු කාලසීමාව තුළ දී සිසුන්ට වෘත්තීය සමිති කටයුතුවල නිරතවීමට හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිදු අයිතිවාසිකමක් නොමැත.

11.8 පාඨමාලාවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණයවන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයක් උදාවුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය, අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

වෛද්‍ය එස්. එච්. මුණසිංහ,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2021 දෙසැම්බර් මස 09 වැනි දින,
"සුවසිරිපාය"
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

12-604

---

සංශෝධනයයි

**කම්කරු අමාත්‍යාංශය**

කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2021

අංක 2256 දරන 2021 නොවැම්බර් මස 26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළකරන ලද ''කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2021'' විභාග නිවේදනයේ 02 සුදුසුකම් ඡේදයේ 2.3 වෙනත් සුදුසුකම් කොටස පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

02. *සුදුසුකම්* :
2.3 වෙනත් සුදුසුකම්

(i) පත්වීම ස්ථිර කර තිබීම;
(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබීම.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

02. එම *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත්වෙන අතර මෙම සංශෝධනය හේතුවෙන් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2022.01.18 තෙක් දීර්ඝ කරනු ලැබේ. අයදුම්කරුවන් තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයවන විට සම්පූර්ණ කර තිබිය යුතුය.

03. මේ වනවිටත් මෙම විභාගය සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් මෙම සංශෝධන හේතුවෙන් නැවතත් අයදුම්පත් යොමු නොකරන ලෙස දැනුම් දෙනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 දෙසැම්බර් මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කම්කරු මහ ලේකම් කාර්යාලය,
නාරාහේන්පිට,
කොළඹ 05.

12-768

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.